වේලනායි ප්‍රාදේශීය සභාව
යාපනය දිස්ත්‍රික්කය
----------------------

1. මූල්‍ය ප්‍රකාශන
--------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
-----------------------------------

2017 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 11 දින සභාපති වෙත ඉදිරිපත් කරන ලදී.

1.2 තත්ත්වාගණනය කළ මතය
---------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට වේලනායි ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
------------------------------------

1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති
------------------------

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව්කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
-----------------------

(අ) ප්‍රාදේශීය සභාව විසින් සමාලෝචිත වර්ෂය තුළ භාවිතා කළ වාහන 23 ක් සභාවට අයිතිව නොතිබුණි. එසේවුවද, ඒවායේ වටිනාකම් එකතුව රු.18,215,636 ක් වශයෙන් තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර තිබූ බැවින්, මෝටර් රථ වටිනාකම රු.18,215,636 කින් සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) සභාව විසින් ඉදිකර භාවිතා කරන සුසාන භූමි 15 වටිනාකම් අනුමත තක්සේරුකරුවකු වෙතින් තක්සේරුකර පසුගිය වසර 1 ක සිට වසර 5 දක්වා කාලය තුළදීම මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබූ බැවින් මූල්‍ය ප්රකාශනවල ගොඩනැගිලි වටිනාකම අඩුවෙන් දක්වා තිබුණි.

1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්
---------------------------------

ගෙවිය යුතු ගිණුම්
---------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) 2015 වසරේ පටන් නිලධාරියෙකුට නොගෙවන ලද රු. 29,335 ක්වූ වැටුප් හා වේතන සම්බන්ධයෙන් උසාවි තීන්දුවක් ලබාගෙන තිබුණි. කෙසේවෙතත්, ඒ අනුව අදාළ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) සේවා නියුක්තියන්ගේ අරමුදලට ප්‍රේෂණය නොකර, එකතුව රු.10,810 ක්වූ සේවක දායක මුදල් පසුගිය වසර 12 ක් පුරාම මිශ්‍ර තැන්පතු ගිණුමේ රඳවාගෙන තිබුණි.

(ඇ) විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙත ප්‍රේෂණය නොකර, එකතුව රු.10,468 ක් වූ වැන්දඹු/කාන්තා වැන්දඹු අරමුදලේ දායක මුදල් පසුගිය වසර නවයක් පුරාම මිශ්‍ර තැන්පතු ගිණුමේ රඳවාගෙන තිබුණි.

1.3.4 අනුකූල නොවීම

නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති,රීති රෙගුලාසි සහ කළමනාකරණ තීරණ යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති<br>III පරිච්ඡේදයේ 32 වගන්තිය | | දේපළ මත තක්සේරු බදු ලේඛනය සභාව විසින් නඩත්තුකර නොතිබූ අතර, සමාලෝචිත වර්ෂය තුළදී වරිපනම් හා බදු අයකර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි<br>මුදල් රෙගුලාසි 571 | 102,782 | කල් ඉකුත් තැන්පතු වර්ග තුනක් පිළිබඳ අර්ථවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| (ඇ) | රාජ්‍ය පරිපාලන සහ කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ | | |
| | (I) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 චක්‍රලේඛය | | පසුගිය වසරක කාල පරිච්ඡේදය තුළ වාහන 27 ක ඉන්ධන දහනය පරීක්ෂාකර නොතිබුණි. |
| | (II) 2008 ජුනි 26 දිනැති අංක 13/2008 චක්‍රලේඛය | | වාහන 10 ක දෛනික ධාවන සටහන් පසු මාසයේ 15 වෙනි දිනට පෙර විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ඈ) | උතුරු පළාත් මුදල් චක්‍රලේඛය 2017 මාර්තු 07 දිනැති අංක පීඑස්/01/2017 | | නිලධාරීන් 08 දෙනෙක් විසින් ඇප මුදල් ගෙවා නොතිබුණි. |

1.3.4.2 බදු නියමයන්ට අනුකූල නොවීම

සමාලෝචිත වර්ෂය තුළ සභාව විසින් භාවිතා කළ වාහන 35 ක් සඳහා වූ වාර්ෂික වාහන ආදායම් බලපත්‍ර ගණනය කර ගෙවීමට කටයුතු කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.9,196,073 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.11,181,818 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

-----------------------

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්,බිල් කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

---------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්,බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු | රු. | රු. | රු. |
| (i)වරිපනම් හා බදු | 663,800 | - | 970,000 | - | 786,000 | - | 710,617 | 150,183 |
| (ii) කුලී | 684,900 | - | 3,150,962 | 115,271 | 1,418,200 | - | 1,385,090 | - |
| (iii)බලපත්‍ර ගාස්තු | 379,000 | - | 297,480 | - | 244,900 | - | 314,470 | - |
| (iv)වෙනත් ආදායම් | 8,049,790 | - | 7,448,548 | - | 6,926,250 | - | 11,811,313 | - |
| එකතුව | 9,777,490 | - | 11,863,390 | 115,271 | 9,386,150 | - | 14,221,490 | 150,183 |

(ආ) සභාව විසින් දේපළ තක්සේරු කිරීම සිදු නොකළ බැවින් වරිපනම් හා බදු ආදායම් උපලේඛනගත කර නොතිබුණි.

#### 2.2.2 බදු ගාස්තු

--------------

බදු දෙන ලද දේපළ 07 ක් වෙනුවෙන් වූ එකතුව රු.89,021 ක්වූ හිඟ බදු අයකර ගැනීම සඳහා සභාව අර්ථවත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

#### 2.2.3 මුද්දර ගාස්තු

-----------------

2017 දෙසැම්බර් 31 දිනට උතුරු පළාත් සභාවේ ප්‍රධාන ලේකම් වෙතින් රු.2,004,750 ක මුද්දර ගාස්තු දිගින් දිගටම අයවීමට තිබුණි.

### 2.3 අධිභාර

---------

නිල වාහන දෙකක් සඳහා වාහන බලපත්‍ර ආදායම් ගාස්තු ගෙවීමට ප්‍රමාදවීම හේතුකොට ගෙන සභා අරමුදලෙන් රු.2,670 ක දඩ මුදලක් ගෙවා තිබුණි. එනමුත් එය ඊට වගකිව යුතු නිලධාරියාගේ අය කිරීමට නොහැකි වූ හේතු විගණනයට දන්වා නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

--------------------------------

3.1 කාර්යසාධනය

----------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වගන්තියට අනුව සභාව විසින් මහජන සෞඛ්‍ය කරුණු පාලනය කිරීම් සහ පරිපාලනය සහ සාමාන්‍යය ජනතාවගේ සුවවිහරණය, පහසුකම්, සුභසාධනය සහ ආරක්‍ෂා කිරීම හා වැඩිදියුණු කිරීම පිළිබඳව හෙළිවූ කරුණු පහත සඳහන් පරිදි විය.

සන අපද්‍රව්‍ය කළමනාකරනය

---------------------------------------

වේලානි උප කාර්යාලය සහ අල්ලායිපිටි උප කාර්යාල බල ප්‍රාදේශවල සන අපද්‍රව්‍ය ජාතික ප්‍රතිපත්තියට අනුව වෙන් කිරීම සඳහා සභාව විසින් අර්ථවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

----------------------------------

පසුගිය වසර 05 ක් පුරාම දේපළ 6183 ක් සඳහා වූ වරිපනම් සහ බදු තක්සේරු කර අයකර ගැනීම සඳහා සභාව විසින් අර්ථවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

3.3 කළමනාකරණ අකාර්යක්‍ෂමතා

--------------------------------------

පහත සඳහන් කරුණු නිරීක්‍ෂණය විය.

(අ) පසුගිය වසර 05 පුරාම සභාවට අයත් කඩ කාමර 28 ක් සඳහා වූ කුලි කොන්ත්‍රාත්තුව වාර්ෂිකව අලුත් කිරීම සඳහා සභාව විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) සුසාන භූමි 15 ක දේහ ආදාහනය සඳහා අවසරදීම සහ සුසාන භූමි බදු අයකර ගැනීම සඳහා අර්ථවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) විදුලි සන්දේශ කුළුණු ගොඩනැගිලි හතරක් සඳහා අනුමැතිය ලබාගැනීම සහ වාර්ෂික බද්ද තක්සේරු කිරීම සිදුකර නොතිබුණි.

(ඇ) දිළිදුබව තුරන් කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනයේ රු. 25,000 ක මුදලක් වෙන්කර තිබුණ.එසේවුවද, එය ක්‍රියාත්මක කර නොතිබුණි.

3.4 මානව සම්පත් කළමනාකරණය

-------------------------------------

පහත සඳහන් කරුණු නිරීක්‍ෂණය විය.

(අ) සභාව විසින් විධිමත් පරිදි මානව සම්පත් බඳවා ගැනීම සහ යෙදවීම සිදුකර නොමැති බැව් විගණනයේදී නිරීක්‍ෂණය විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් මානව සම්පත් 22 ක් විසින් නිම කළ යුතු කාර්යයන් ප්‍රමාදවී තිබුණි.

(ආ) තනතුර හැරගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.35,295 ක්වූ හිඟ කාර්ය මණ්ඩල ණය අයකර ගැනීම සඳහා පසුගිය වසර දහයකට අධික කාලයක් පුරාම සභාව විසින් අර්ථවත් ක්‍රයාමාර්ග ගෙන නොතිබුණි.

3.5 කොන්ත්‍රාත් පරිපාලනය

----------------------------

මුලුමනින්ම අත්හැර දැමූ ව්‍යාපෘති

-------------------------------------

සමාලෝචිත වර්ෂය තුළදී ක්‍රියාත්මක කළ යුතු ව්‍යාපෘති 72 ක් ක්‍රියාත්මක නොකර ඒවා මුළුමනින්ස අත්හැර දමා තිබූ හෙයින් සභාව ප්‍රමාණවත් අන්දමින් ආදායම් ලබාගෙන නොතිබුණි.

3.6 වත්කම් කළමනාකරණය

----------------------------

3.6.1 අක්‍රිය වත්කම්

------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) වටිනාකම රු.19,174,046 ක්වූ ශරීර යෝග්‍යතා මධ්‍යස්ථානයක් සහ වෙළඳ සංකීර්ණයක් පසුගිය වසර 01 සිට වසර 02 ක කාලයක් තිස්සේ අක්‍රියව පැවතිණි.

(ආ) සභාවට අයත් වාහන 18 ක් අක්‍රියව පැවතිණි.

(ඇ) බදු දීම සඳහා වූ සභාවට අයත් වෙළඳ පොලවල් සහ කඩකාමර ඇතුළත් දේපළ 13 ක්, ඒවා අපේක්ෂිත කටයුතු සඳහා උපයෝගී කර නොගෙන අක්‍රියව පැවතිණි.

(ඈ) සභාවට අයත් කඩකාමර 6 ක් පසුගිය වසර 01 සිට වසර 05 ක කාලයක් තිස්සේ අක්‍රියව පැවතිණි.

3.6.2 ආර්ථික සමීක්ෂණ මණ්ඩල

------------------------------

සභාවේ උප කාර්යාල 5 ක සහ පුස්තකාලවල සමීක්ෂණ මණ්ඩල පැවැත්වීමේදී භාණ්ඩ 113 ඌනතා සහ භාණ්ඩ 06 ක අතිරික්ත නිරීක්ෂණයවී තිබුණි. එනමුත් මේ සම්බන්ධයෙන් උතුරු පළාතේ මුදල් රීති 365 ප්‍රකාරව අර්ථවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

3.6.3 වත්කම් භාරදීමට අසමත්වීම

----------------------------------

සභාව විසින් භාවිතා කරන වාහන 12 ක් සභාවට අයත්ව නොතිබුණි.

4. වගකීම්භාරය සහ යහපාලනය

-----------------------------------

4.1 අයවැය පාලනය

-------------------

අයවැයගත ආදායම හා තත්‍ය ආදායම අතර රු.1,520 සිට රු.2,466,062 හෙවත් සියයට 21 සිට සියයට 360 දක්වා සහ අයවැයගත වියදම හා තත්‍ය වියදම අතර රු.3,220 හිහ රු.9,477,309 හෙවත් සියයට 11 සිට සියයට 25 දක්වා පරාසයක විචලන නිරීක්ෂණය විය.

4.2 ප්‍රසම්පාදනය

------------------

4.2.1 ප්‍රසම්පාදන සැලැස්ම

---------------------------

2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 වගන්තිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා සභාව විසින් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

4.2.2 විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීම්

-----------------------------------------------------

සභා කටයුතු කාර්යක්ෂමව සිදු කිරීම සඳහා අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04 ක් පැවැත්විය යුතුවේ. එනමුත් සමාලෝචිත වර්ෂයතුළදී විගණන හා කළමනාකරණ කමිටු දෙකක් පමණක් පවත්වා තිබුණි.

5. පද්ධති හා පාලන

-----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමු කර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතුය. .

| පද්ධතිය | අඩුපාඩු |
|---|---|
| ---------- | ------------ |
| ගිණුම්කරණය | පාඩු ලේඛනය, මිණුම් පත්‍ර ලේඛනය හා ඉඩම් විකුණුම මත බදු සඳහා වූ ලේඛනය නඩත්තු කිරීමට අසමත් වීම. |